# Buddhist Perspective on Reducing Over-consumption for a Better Global Economy while Purifying the Individual's Mind

**Ven. Pepiliyawala Narada[1], Ven. Wilgamuwe Piyananda[2]**

## Introduction

Overconsumption is simply the consumption of goods and services to excess. In modern times, it has already been a hierarchy issue that has led the world to a huge decadence of socio-economic and environmental scope. Similarly, over-consumption, is defined as, excessive consumption or use of goods and services such as energy, land, water or materials etc) that cause harmful or detrimental effects to humans and/or the environment, namely by exceeding the carrying capacity and life-supporting system of the planet and its ecosystem ("Using GEMET".2024). Due to the impact of various policies and regulations by government and organisations to mitigate the effect of over-consumption, it seems to rise continuously. Many of these strategies are based and focus on external solutions such as implementing new rules, etc. but not on the mental attitudes of the human. This research aims to explore to potential of Buddhist teachings specifically principles of mind purification to address the root causes of over-consumption.

## Research Problem

The current solutions to reduce the over-consumption in global economy are insufficient due to the lack of attention to mental and attitudinal causes of people. Therefore while focusing on mind and ethical conduct How and what are the new solutions that could be implemented the global overconsumption is the main research problem of this research.

## Research Methodology

This research adopts a qualitative approach, utilizing both primary and secondary sources. The Sutta Pitaka and commentaries are referred to under primary sources and relevant academic articles, journals and publications are referred under secondary sources to conclude. Comparative analysis and textual analysis also be followed.

1. Department of Buddhist Philosophy, Buddhist & Pali University. narada@bpu.ac.lk
2. Department of Buddhist and Pali Studies, Bhiksu University of Sri Lanka, wilpiyananda@busl.ac.lk

**Results and Discussion**

Over-consumption has been a core problem in a contemporary society driven by consumerism, industrialization and the relentless pursuit of economic growth which has grown as a global phenomenon in present. Further, it had a bad impact on natural resources, food, energy etc. far beyond the necessities for well-being. The detrimental effects on society, as well as the environment, had been caused due to this such as climate change, deforestation, and exhaustion of non-renewable resources.

Therefore, many organizations, as well as government affairs, follow many policies to avoid over-consumption by introducing new rules and regulations, implementing new taxes, advertising to make aware people of recycling motivating new eco-friendly products etc. while being aware of society on the current issue.

Nevertheless, over-consumption is gradually increasing without provable effect. Some what the solutions that had been taken had been able to diminish the over-consumption but not significantly. As an objective observer, the current solutions are somewhat deficient and do not reach their ultimate or splendid level.

Accordingly, Buddhism draws out many theories for the reduction of over-consumption through a mind-based policy that is related to the purification of the mind is the main object of the research. Here, in this manner changing the attitude of people is more prominent than proclaiming rules and regulations.

Buddhism draws out three causes for over-consumption, known as defilement, which are based on the mind, gathita (bound), mucchita (becoming unconscious), and ajjhāpanna (excessive). (DN3:PTS:43p.) Firstly, while eradicating these mental natures the solutions for over-consumption will be more fruitful than the present. It's not laid-back in eradicating these mentalities but it’s the main. Buddhism often emphasises assāda (enjoyment), its ādīnawa (danger) and nissaraṇa (escape from [which generates danger]). (SN3:PTS:62.p) These teachings should be included in school education as a long-term utility for the deduction of over-consumption.

Similarly, the teachings on mindfulness/awareness (sati) are more effective. The nature of people is the quest for happiness through material possessions while overlooking psychological and emotional background. Happiness is generated in the mind, not in material. Therefore, spiritual happiness as well as mundane happiness is highly possible to generate while practicing mindfulness as a key solution to the problem.

Ethical conduct such as loving-kindness (mettā) and compassion (karuṇā), the sublimes, should be spread not only for the present but also for the future generation. Including the environment above is a better solution for over-consumption.

Sutta Pitaka also further illustrates the concept of Samajīvikatā, the balanced livelihood of a house-holder, and how he/she should manage his/her needs refraining from over-consumption. An individual while knowing his/her income should manage the expenditure. (AN4:PTS:283p.) Similarly, Buddhism further emphasizes the essence of consumption and introduces a consumption policy which is quoted above. Further, knowing the sufficient needs for the existence of human life an individual must manage accordingly to the above.

The Buddhist practices, particularly meditation, mindfulness and ethical behaviour are followed by non-Buddhist as universal codes. While introducing them to primary and secondary education with the meditational practices it is more effective for the decrease of overconsumption.

## Conclusion

Over-consumption is a global issue that impacts badly for both humans and the environment. The current solutions that have been taken to control the situation are not significantly successful due to a lack of attention to the psychological and emotional behaviour of the person. Buddhist mind purification methods can effectively reduce over-consumption such as consumption policy, mindfulness, and meditation on loving-kindness & compassion which is based on the mentality of the individual. Including these practices and meditation in school education will significantly influence the reduction of global over-consumption and the betterment of the global economy.

**Keywords:** Buddhism, Mindfulness, Overconsumption, Policy, Samajīvikatā

## References

*Aṅguttaranikāya*. London: Pali Text Society, Chatta Samngayan 4.0 Tripitaka series

*Dīghanikāya*. London: Pali Text Society, Chatta Samngayan 4.0 Tripitaka series

General Multilingual Environmental Thesaurus (GMET), https://www.eionet.europa.eu/gemet/en/concept/15382

Hettiarachchi, Dharmasena. (2001). *Buddhist Economic Philosophy*. Colombo: Educational Publication Department

*Saṃyuttanikāya*. London: Pali Text Society

Schumacher, E.F. (1973). S*mall is Beautiful: Economic as if People Mattered*. New York: Harper & Row Publications

# පුද්ගලත්ව සංවර්ධනය ඇති කිරීමෙහිලා පාරිසරික වස්තූන් භාවිතයට ගෙන ඇති ආකාරයඃ අංගුත්තර නිකායේ චතුක්ක නිපාතය ඇසුරින්

**සමන් රාජපක්ෂ[1], අමාලි උත්පලා නන්දසිරි[2]**

**හැඳින්වීම**

පුද්ගලත්වය (Individuality) යනු පුද්ගලයා සිය ජීවන පැවැත්මට අදාළ අනන්‍යතාව ආරක්ෂා කර ගන්නා ආකාරය යි. එමෙන් ම සිය අනන්‍යතාව අන් අයට ප්‍රකට කරවන ආකාරය යි. මෙහි දී පුද්ගලයා වෙතින් පිළිබිඹු කෙරෙන ඔහු සතු හැකියාව, කුසලතාව, ඉවසීම, වීර්යවන්ත බව, දයාවන්ත බව වැනි ගුණාංග මෙන් ම චර්යා ධර්මවල සමස්තය පුද්ගලත්වය වශයෙන් හැඳින්වේ. මිනිසාට පුද්ගලත්වයට අදාළ ගුණාංග වැඩි දියුණු කර ගැනීම මගින් සිය ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කර ගත හැකි ය.

පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනයේ ද භෞතික සංවර්ධනයේ ද සුසංයෝග යෙන් පුද්ගලත්වය සංවර්ධනය (Individuality Development) ගොඩනැංවේ. බුද්ධ දේශනාව පුද්ගලත්ව සංවර්ධනය පිණිස ඉවහල් වන ඉගැන්වීම්වලින් සමන්විත ය. ඒ අනුව බුදුරජාණන් වහන්සේ පුද්ගලයා ආධ්‍යාත්මික සංවර්ධනය සහ භෞතික සංවර්ධනය අත්පත් කර ගැනීමේ දී ක්‍රියා කළ යුතු ආකාරය විවිධ සූත්‍ර දේශනා ඔස්සේ පෙන්වා දී ඇත.

**පර්යේෂණ ගැටලුව**

පුද්ගලත්වය සංවර්ධනය කිරීමෙහි ලා අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයට අයත් දේශනාවන් තුළ පාරිසරික වස්තූන් භාවිතයට ගෙන ඇත්තේ කෙසේ ද?

**සාහිත්‍යය විමර්ශනය**

පුද්ගලත්වය සංවර්ධනය කිරීමෙහි ලා පාරිසරික වස්තූන් භාවිතයට ගෙන ඇති ආකාරය පිළිබඳ සිදු කළ මෙම අධ්‍යයනයට සමගාමීව පාරිසරික වස්තූන් හා මානව ජීවිතය සම්බන්ධ සිදු කර ඇති අධ්‍යයන පිළිබඳ මෙහි දී අවධානය යොමු කෙරිණි.

පාරිසරික වස්තූන් සහ පෞද්ගලික අත්දැකීම් අතර පවතින අන්තර් ක්‍රියාකාරිත්වය පිළිබඳ සන්නිවේදන හා මනෝවිද්‍යාත්මක ප්‍රවේශයකින් අධ්‍යයන සිදු කර තිබේ. එහි දී පෙන්වා දෙන්නේ පාරිසරික වස්තූන් පුද්ගල පෞරුෂය සංවර්ධනය කිරීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන බව යි. මෙම අධ්‍යයන මගින් පාරිසරික

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
saman.rajapaksha@kln.ac.lk
2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
amali.nandasiri@kln.ac.lk

වස්තූන් පුද්ගල අන්තර්ක්‍රියා පැවැත්වීම, චිත්තවේගී යහපැවැත්ම සහ පුද්ගල අනන්‍යතා ගොඩනැගීම කෙරෙහි ද වැදගත්වන බව පෙන්වා දී ඇත. පුද්ගලයා සංස්කෘතික උරුමයෙන් ලබන සමාජ බලපෑම් යටත් වේ. ඊට අමතර ව පුද්ගල අන්තර් ක්‍රියා කෙරෙහි පාරිසරික වස්තූන්ට බලපෑම් ඇති කළ හැකි බව පෙන්වා දී ඇත (Bronfenbrenner,1979).

විද්වත් අධ්‍යයන මගින් ද්‍රව්‍යමය පාරිසරික වස්තූන් සහිත පරිසරය පුද්ගලයන්ගේ අනන්‍යතා මෙන් ම ඔවුන්ගේ පෞරුෂය හැඩගස්වන බව පෙන්වා දී ඇත. මෙහි දී පාරිසරික වස්තූන් පිළිබඳ සමාජයේ මානවයන් අතර පවතින විවිධ අර්ථයන් සහ සංස්කෘතික වටිනාකම් පුද්ගලයෙකුගේ ස්වයං ගති ලක්ෂණ සහ හැසිරීම්වලට ද බලපෑම් කරන බව සාකච්ඡා කෙරේ (Csikszentmihalyi, Halton1981).

සමාජ ඉගෙනුම් න්‍යාය මගින් ද පුද්ගල පෞරුෂ සංවර්ධනය සඳහා පාරිසරික වස්තූන්වල උපයෝගීතාව පෙන්වා දී ඇත. එහි දී පුද්ගල හැසිරීම් හා කුසලතා වැඩි දියුණු කර ගැනීමට පාරිසරික වස්තූන් භාවිත කළ හැකි බව දක්වයි. මෙම අධ්‍යයනය මගින් පාරිසරික වස්තූන් මගින් පුද්ගලයා තුළ සමාජශීලීත්වය, විශ්වසනීයත් වැනි පෞරුෂ ලක්ෂණ ගොඩනංවාගත හැකි බව පෙන්වා දී ඇත (Bandura,1977).

සොබාදහම සහ යහපැවැත්ම පිළිබඳ සිදු කළ පර්යේෂණ මගින් පෙන්වා දී ඇත්තේ පාරිසරික වස්තූන් පුද්ගලයා සතු ධනාත්මක පෞරුෂ ලක්ෂණ ඇති කිරීමෙහි ලා වැදගත් වන බව යි. එහි දී ස්වභාවික පරිසරයට ඔරොත්තු දීමේ හැකියාව, චිත්තවේගීය ස්ථාවරත්වය සහ විවෘතභාවය වැනි ධනාත්මක පෞරුෂ ලක්ෂණවලට පාරිසරික වස්තූන් දායක වන බව පෙන්වා දෙයි. මෙමගින් අවධාරණය කරනුයේ පාරිසරික වස්තූන් සහිත සොබාදහම සමඟ අන්තර්ක්‍රියා කිරීම ඔස්සේ පුද්ගල පෞරුෂ වර්ධනයට අත්‍යවශ්‍ය වන සංජානන ක්‍රියාකාරීත්වය සහ චිත්තවේගීය යහපැවැත්ම වැඩි දියුණු කරන බව යි (Kaplan, Kaplan, 1989).

එසේ ම ඇතැම් අධ්‍යයනවලින් පෙන්වා දෙන්නේ පරිසරයේ පවතින නිර්මාණශීලී කලා වස්තූන් මගින් පුද්ගලයාගේ ස්වයං ප්‍රකාශනය වැනි පෞරුෂ සංවර්ධනයේ තීරණාත්මක සංරචක පෝෂණය කරන බව යි. එහි දී පාරිසරික වස්තූන් පුද්ගලයාගේ කලාත්මක ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ කිරීම මගින් පුද්ගල සංජානන නම්‍යශීලීභාවය සහ චිත්තවේගීය බුද්ධිය ප්‍රවර්ධනය කරන බවත් එමගින් විවෘතභාවය සහ එකඟතාවය වැනි පෞරුෂ ලක්ෂණ වැඩි දියුණු කරන බවත් පෙන්වා දෙයි (Lutz,2017). මෙම අධ්‍යයනය මගින් පුද්ගල පෞරුෂ වර්ධනය සඳහා පාරිසරික සාධක ප්‍රායෝගිකව අත්විඳීමේ වැදගත්කම තවදුරටත් අවධාරණය කරයි.

තව ද, පුද්ගලත්වය සංවර්ධනය පිළිබඳ බෞද්ධ දාර්ශනික ප්‍රවේශයකින් අධ්‍යයන සිදු කර ඇත. එහි දී භෞතික සංවර්ධනය මෙන් ම ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා බුදුරජාණන් වහන්සේ විසින් සිදු කළ දේශනා උපයෝගී කර ගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යයනය කර ඇත. සංවර්ධනය සඳහා සන්නිවේදනය යොදා ගැනීමේ දී බෞද්ධ දර්ශනය මගින් පෙන්වා දෙන දාර්ශනික සංකල්පනා සංවර්ධනය සඳහා නව විවරණයන් සපයන බව පෙන්වා දී ඇත (රාජපක්ෂ, 2021).

මෙයට අමතර ව පරිසර සංරක්ෂණයෙහි ලා බෞද්ධ දාර්ශනික ඉගැන්වීම්

භාවිතයට ගත හැකි ආකාරය පිළිබඳ ව ද අධ්‍යයන සිදු කර ඇත. එහි දී අවධානය යොමු කර ඇත්තේ සම්බුද්ධ දේශනා ඇසුරින් පරිසර සංරක්ෂණයට අදාළ ව පරිසර දූෂණය පිටු දැකීම හා පරිසර සංරක්ෂණයට අදාළ ව පවතින විවිධ ඉගැන්වීම් පිළිබඳ ව යි (Rajapaksha,Nandasiri,2016). වර්තමානයේ ජාත්‍යන්තර හා ජාතික මට්ටමින් නිර්මාණය වී ඇති පාරිසරික ගැටලු මඟහරවා ගනිමින් පරිසරික තිරසාරත්වය පිණිස බෞද්ධ දාර්ශනික ඉගැන්වීම් භාවිත කළ හැකි බව එහි දී පෙන්වා දී ඇත.

**පර්යේෂණ අරමුණු හා වැදගත්කම**

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ පුද්ගලත්වය සංවර්ධනය කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ දේශනා තුළ පාරිසරික වස්තූන් භාවිතයට ගෙන ඇති ආකාරය අධ්‍යයනය කිරීම යි. බුද්ධ දේශනාව තුළ පුද්ගලයාගේ ජීවිත පැවැත්මට සමීප පාරිසරික වස්තූන් උපයෝගී කර ගනිමින් පුද්ගලත්ව සංවර්ධනය ඇති කිරීමට කටයුතු කර ඇති ආකාරය අධ්‍යයනය කිරීම, පුද්ගලත්ව සංවර්ධනය ඇති කිරීමේ දී සන්නිවේදන ක්‍රමෝපායක් වශයෙන් පාරිසරික වස්තූන් උපමාවට ගෙන ඇති ආකාරය විමර්ශනය කිරීම හා පාරිසරික වස්තූන්හි ස්වභාවය අනුව පුද්ගලයාගේ කායික මානසික චර්යා විවරණය කර ඇති ආකාරය විමර්ශනය කිරීම සෙසු අරමුණු වශයෙන් දැක්විය හැකි ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය භාවිතයට ගැනිණි. එහි දී අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයට අයත් සූත්‍ර දේශනා ඇසුරින් දත්ත රැස් කෙරිණි. අංගුත්තර නිකායේ චතුක්ක නිපාතය පණ්ණාසක පහකින් සහ වග්ග විසි හතකින් සමන්විතය. මෙහි අන්තර්ගත සූත්‍ර අතරින් අධ්‍යයන අවශ්‍යතාව මත සූත්‍ර 17 ක් නියැදිය ලෙස තෝරා ගැනුණි. තේමාත්මක ස්වයං දත්ත විශ්ලේෂණය යටතේ දත්ත විශ්ලේෂණය කෙරිණි.

**ප්‍රතිඵල**

බුදුදහම හඳුන්වා දෙන පුද්ගලත්ව සංකල්පයේ පදනම වන්නේ ආධ්‍යාත්මක සංවර්ධනය යි. බුදුදහමේ විවරණය කෙරෙන ආධ්‍යාත්මික සංවර්ධනය කොටස් තුනක් යටතේ සාකච්ඡා කළ හැකි ය.

i. පුද්ගලයා සිය අනන්‍යතාව ගොඩනගා ගන්නා ආකාරය
ii. පුද්ගලයා සිය අනන්‍යතාව හා ප්‍රතිරූපය අන් අයට ප්‍රකට කරන ආකාරය
iii. පුද්ගලයා සිය අනන්‍යතාව හා ප්‍රතිරූපය අන් අය හමුවේ ප්‍රකට කිරීමේ දී චර්යා ධර්ම හා ආචාරවිද්‍යාත්මක ගුණාංග යොදා ගන්නා ආකාරය

අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ එන සූත්‍ර දේශනා පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනයට අදාළ ගුණාංග පෝෂණය කිරීමට සමත් වී ඇති බව පෙනේ. මෙහි දී ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීමෙහි ලා පාරිසරික වස්තූන් නිර්මාණශීලී අයුරින් භාවිතයට ගෙන ඇත. එම පාරිසරික වස්තූන්ගේ ක්‍රියාකාරීත්වය පුද්ගල චර්යාවට

ආදේශ කර දැක්වීම මගින් පුද්ගලයාට ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කර ගත හැකි ආකාරය බුදුරාජාණන් වහන්සේ පැහැදිලි කළහ.

උපක්කිලෙස සූත්‍රයට අනුව සඳ හිරු, වලාකුළු, හිම, දුම් හා දූවිලි, රාහු අසුරිඳු යන පාරිසරික වස්තූන් ඇසුරින් පුද්ගල චර්යා ධර්මවල ස්වභාවය පෙන්වා දී ඇත (අ.නි.සස,2006,පි.102-104). එහි දී වලාකුළු, හිම, දුම් හා දූවිලි රාහු අසුරිඳු වැනි කිලිටු ද්‍රව්‍ය නිසා සඳ හිරු නොබබළන්නාසේ මහණ බමුණන් ද නොබැබළීමට හේතු වන කිලිටි වර්ග හතරකි. ඒවා උපක්ලේශ වශයෙන් හඳුන්වයි. ඇතැම් මහණ බමුණෝ රහමෙර පානය කිරීම, මෛථුන්දම් සේවනය කිරීම, රන් රිදී පිළිගැනීම, මිථ්‍යා ජීවයෙන් යුතු වීම ආදි චර්යාවන් හේතුවෙන් කිලිටි වෙති. සිය ආධ්‍යාත්මය අපවිත්‍ර කර ගනිති. ඔවුන් සිය ආධ්‍යාත්මය කිලිටි කර ගැනීම නිසා අන් අය ඉදිරියේ නොබබළයි. ඔවුන් අන් අයගේ දෝෂ දර්ශනයටත්, අවඥාවටත් පාත්‍ර වෙයි.

අහි සූත්‍රය මගින් විරූපාක්ෂ, එරාපථ, ඡබ්‍යාපුත්ත, කණ්හාගොතමක, සර්ප රාජ කුල හතරක් පිළිබඳ ව පෙන්වා දෙයි (අ.නි.ii,2006,පි.134-136). සර්පරාජ කුල කෙරෙහි මෙත් සිත නොපැතිරවීම නිසා භික්ෂුවක් සර්ප දෂ්ඨනයෙන් මිය යයි. තමාගේ රැකවරණය හා ආරක්ෂාව පිණිස සියලු සර්ප වර්ගයාට මෛත්‍රිය පැතිරවිය යුතු ය. එමෙන් ම ගොනුසු, මකුළු, හූනු, මී වැනි සත්ත්වයන්ගෙන් ද සියලු අපා, දෙපා, බහුපා සතුන්ගෙන් ද ආරක්ෂා වීම පිණිස ඔවුන් කෙරෙහි මෙත්සිත වැඩිය යුතු ය. මෙමගින් පැහැදිලි වන්නේ පුද්ගලයාගේ ආධ්‍යාත්මික සහනශීලීත්වය සතුරු උවදුරු නැතිවීම කෙරෙහි හේතුවන බව යි.

යමක උපත එහි විනාශයට හේතුවන බව දේවදත්ත සූත්‍රයේ දැක් වේ (අ.නි.ii,2006,පි.136-138). කෙසෙල් ගස, උණ ගස, බට ගස, අශ්වතරිය වැනි පාරිසරික වස්තූන් පසු කලෙක ඒවායෙහි ම විනාශයට හේතු වන්නාක් මෙන් පුද්ගල චර්යා පෙරළා පුද්ගල ජීවිතය කෙරෙහි සිදු කරන බලපෑම මෙම සූත්‍රයෙන් පෙන්වා දෙයි. කෙසෙල් ගස, උණ ගස, බට ගස පීදීම නිසා විනාශයට පත් වේ. අශ්වතරිය ගැබ් ගැනීම නිසා විනාශ වී යයි. මෙලෙස ඵලය හේතුවෙන් ගස නැසී යයි. මෙපරිද්දෙන් ලාභ සත්කාර, කීර්ති ප්‍රශංසා හේතුවෙන් නරක මිනිසා විනාශයට පත් වේ.

අධම්මික සූත්‍රයට අනුව ගවරැළක නායක ගවයා ඇදට හෙවත් වැරදි මාර්ගයේ ගමන් කරන්නේ නම් සෙසු ගවයෝ ද ඇදට හෙවත් වැරදි මාර්ගයේ ම ගමන් කරති (අ.නි.ii,2006,පි.142). නායක ගවයා නිවැරදි මාර්ගයේ ගමන් කරන්නේ නම් රැළෙහි සෙසු ගවයෝ ද ඔහු අනුව යමින් නිවැරදි මාර්ගයේ ම ගමන් කරති. රටක නායකයා අධාර්මික නම්, දූෂිත නම් එරට ජනතාවගේ ජීවිත පැවැත්ම දුක්ගැහැටවලට ලක්වේ. නායකයා ධාර්මික නම් එරට ජනතාවගේ පැවැත්ම සැපවත් වේ. සුවපත් වේ. නායකයාගේ යහපැවැත්ම සිය අනුගාමිකයින්ගේ ආත්ම සංවර්ධනය කෙරෙහි හේතුවන අයුරු පෙනී යයි.

ඡවාලාත සූත්‍රයේ දී යහපත් පුද්ගලයෙකුගේ ප්‍රතිරූපය පිළිබඳ ගෙනහැර දක්වයි (අ.නි.ii,2006,පි.180-182). ඒ බව කිරි, දී, වෙඬරු, ගී, ගීමණ්ඩ යන වස්තූන්ගේ අන්තර් ක්‍රියාකාරීත්වය මගින් පෙන්වා දෙයි. දෙනකගෙන් ලබා ගන්නා කිරිවලින් දි සකස් කර ගනී. පසුව දීවලින් වෙඬරු ද, වෙඬරුවලින් ගී ද, ගීවලින් ගීමණ්ඩ ද සකසා ගනියි.

මෙයින් ගී මණ්ඩ අග්‍රවන්නාක් මෙන් තමන්ගේත් අන් අයගේත් හිතසුව පිණිස කටයුතු කරන තැනැත්තා පුද්ගලයන් හතර වර්ගයක් අතුරින් අග්‍රත්වයට ද, ශ්‍රේෂ්ඨත්වයට ද පත්වේ.

වලාහක සූත්‍රයේ දී වලාකුළු වර්ග හතරක් උපමාවට ගනිමින් පුද්ගල හැසිරීම් හි ස්වභාවය පෙන්වා දෙයි (අ.නි.ii,2006,පි.196-198). වලාකුළු වර්ග හතර මෙන් මිනිසුන් කොට්ඨාස හතරක් ද සමාජයේ ජීවත් වෙයි. සමහර වලාකුළු ගොරවයි. නොවසියි. එමෙන් ම සමහර පුද්ගලයෝ කතා කරති. වැඩ නොකරති. සමහර වලාකුළු නොගොරවයි, වසියි. සමහර පුද්ගලයෝ කතා නොකරති. වැඩ කරති. සමහර වලාකුළු නොගොරවයි, නොවසියි. සමහර පුද්ගලයෝ ද කතා නොකරති. වැඩ ද නොකරති. සමහර වලාකුළු ගොරවයි, වසියි. සමහර පුද්ගලයෝ කියති. කරති. එනම් කතා කරති. වැඩ ද කරති. එවැන්නෝ සමාජයේ බුහුමනට පාත්‍රවෙති.

මෙපරිද්දෙන් බුදුරජාණන් වහන්සේ සොබා දහමේ නිර්මාණයන් වන සතුන්, ගස්වැල්, ජලතටාක, වළාකුළු වැනි වස්තූන්ගේ සහ ජීවින්ගේ ස්වභාවය පැහැදිලි කරමින් ඒ අනුසාරයන් පුද්ගලයාගේ කායික, මානසික හා චර්යාත්මක හැසිරීම් හැඩගැස්වීමෙහි ලා අවශ්‍ය උපදේශයන් ලබා දුන්හ.

**නිගමනය**

පුද්ගලත්වය සංවර්ධනය කිරීම පිණිස අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයෙහි පුද්ගල ජීවිත පැවැත්මට සමීප පාරිසරික වස්තූන් සංකේතාත්මකව උපයෝගී කරගනිමින් දේශනා සිදු කර ඇත. මෙහි දී පුද්ගල අර්ථාවබෝධය පිණිස පුද්ගලයාගේ සමාජ, සංස්කෘතික පරිසරයට අනුකූලව සංකේතාත්මක හා නිර්මාණාත්මක ප්‍රවේශයක් භාවිත කර ඇත. පුද්ගලත්වය සංවර්ධනය පුද්ගලයාගේ ආධ්‍යාත්මික හා භෞතික සංවර්ධනයේ සුසංයෝගයෙන් ගොඩනැඟෙන්නෙකි. බුදු දහමේ පෙන්වා දෙන පුද්ගලත්වය සංවර්ධනයේ පදනම ගොඩනැගී ඇත්තේ පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය මූලික කරගනිමිනි.

මේ අනුව බුද්ධ දේශනා තුළ පාරිසරික වස්තූන් උපයෝගි කරගනිමින් පුද්ගලයාට සිය අනන්‍යතාව, ප්‍රතිරූපය, පුද්ගල චර්යා ධර්ම හා ආචාරවිද්‍යාත්මක ගුණාංග වර්ධනය කර ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශය සපයයි.

**මුඛ්‍ය පද:** ආධ්‍යාත්මය, පාරිසරික වස්තූන්, පුද්ගලත්වය, සංවර්ධනය, සූත්‍ර දේශනා

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අංගුත්තර නිකාය ii*, (2006). චතුක්ක නිපාතය, අසුර වග්ගය, ජවාලාත සූත්‍රය, දෙහිවල: බු:ජ:ත්‍රි.

*අංගුත්තර නිකාය ii*, (2006). චතුක්ක නිපාතය, පත්ත කම්ම වග්ගය, අධම්මික සූත්‍රය, දෙහිවල: බු:ජ:ත්‍රි.

*අංගුත්තර නිකාය ii*, (2006). චතුක්ක නිපාතය, පත්ත කම්ම වග්ගය, අහි සූත්‍රය, දෙහිවල: බු:ජ:ත්‍රි.

*අංගුත්තර නිකාය ii*, (2006). චතුක්ක නිපාතය, පත්ත කම්ම වග්ගය, දේවදත්ත සූත්‍රය, දෙහිවල: බු:ජ:ත්‍රි.

*අංගුත්තර නිකාය ii*, (2006). චතුක්ක නිපාතය, රොහිතස්ස වග්ගය, උපක්කිලෙස සූත්‍රය, දෙහිවල: බු:ජ:ත්‍රි.

*අංගුත්තර නිකාය 2*, (2006). චතුක්ක නිපාතය, වලාහක වග්ගය, වලාහක සූත්‍රය, දෙහිවල: බු:ජ:ත්‍රි.

රාජපක්ෂ, සමන්. (2021). *සංවර්ධනය පිළිබඳ බෞද්ධ විවරණය*. කඩවතඃ ඩිමන්‍යා ප්‍රකාශන.

Bronfenbrenner, U. (1979). *The Ecology of Human Development*: Experiments by Nature and Design. Harvard University Press.

Bandura, A. (1977). *Social Learning Theory.* Prentice-Hall.

Csikszentmihalyi, M., & Halton, E. (1981). *The Meaning of Things: Domestic Symbols and the Self*. Cambridge University Press.

Kaplan, R., & Kaplan, S. (1989). *The Experience of Nature: A Psychological Perspective.* Cambridge University Press.

Lutz, C. (2017). "Art and personality development: An interdisciplinary approach." *Psychology of Aesthetics, Creativity, and the Arts*, 11 (2), 180-189.

Rajapaksha, Saman; Nandasiri, Amali Uthpala. (2016). *The Buddhist Philosophical Perspective of Environmental Preservation and Management*. Journalism and Mass Communication, April 2016, Vol. 6, No. 4, 226-236doi: 10.17265/2160-6579/2016.04.006